# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,452 - 2025 අගෝස්තු මස 29 වැනි සිකුරාදා - 2025.08.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... | 1082 |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 1083 |
| අයවැය ලේඛන ... ... | — |
| දේපළ විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 1086 |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 සැප්තැම්බර් 19 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 සැප්තැම්බර් 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජූනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

### කොළඹ මහා නගර සභාව

ගෝසාතක ආඥාපනතේ 272 අධිකාරයේ 17(1) වගන්තිය යටතේ මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව කොළඹ මහා නගර සභාවේ නගරාධිපති වන මා විසින් 2026 වර්ෂය තුළ මෙහි පහත පළමුවැනි ලේඛනයෙහි හා දෙවන උපලේඛනයෙහි සඳහන් දිනයන්හිදී ද, රජය විසින් විටින් විට නිකුත් කරනු ලබන නියෝග අනුව කොළඹ මහා නගර සභා ප්‍රදේශය තුළ මස් පිණිස සතුන් මැරීම, මස් විකිණීම, මස් විකිණීම පිණිස ප්‍රදර්ශනය කොට තැබීම හා මස් වර්ග විකුණනු ලබන ස්ථාන විවෘත කොට තැබීම සපුරා තහනම් කරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

ව්‍රායි බල්තසාර්,
නගරාධිපති,
කොළඹ මහා නගර සභාව.

නගර ශාලාව,
කොළඹ 07,
2025 අගෝස්තු මස 08 වැනි දින.

### පළමුවැනි උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ජනවාරි | 03 | - | දුරුතු මස පුර පසළොස්වක පෝය දිනය |
| පෙබරවාරි | 01 | - | නවම් මස පුර පසළොස්වක පෝය දිනය |
| මාර්තු | 02 | - | මැදින් මස පුර පසළොස්වක පෝය දිනය |
| අප්‍රේල් | 01 | - | බක් මස පුර පසළොස්වක පෝය දිනය |
| මැයි | 01 | - | වෙසක් මස පුර පසළොස්වක පෝය දිනය |
| මැයි | 02 | - | වෙසක් මස පුර පසළොස්වක පෝය දිනට පසු දිනය |
| මැයි | 30 | - | අධි පොසොන් මස පුර පසළොස්වක පෝය දිනය |
| ජූනි | 29 | - | පොසොන් මස පුර පසළොස්වක පෝය දිනය |
| ජූලි | 29 | - | ඇසළ මස පුර පසළොස්වක පෝය දිනය |
| අගෝස්තු | 27 | - | නිකිණි මස පුර පසළොස්වක පෝය දිනය |
| සැප්තැම්බර් | 26 | - | බිනර මස පුර පසළොස්වක පෝය දිනය |
| ඔක්තෝබර් | 25 | - | වප් මස පුර පසළොස්වක පෝය දිනය |
| නොවැම්බර් | 24 | - | ඉල් මස පුර පසළොස්වක පෝය දිනය |
| දෙසැම්බර් | 23 | - | උඳුවප් මස පුර පසළොස්වක පෝය දිනය |

### දෙවන උපලේඛනය

| | | | |
|---|---|---|---|
| පෙබරවාරි | 04 | - | ජාතික නිදහස් දිනය |
| මැයි | 01 | - | ලෝක කම්කරු දිනය |
| ඔක්තෝබර් | 04 | - | ලෝක සත්ත්ව දිනය |

08-293

---

### හොරණ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය යටතේ විරෝධතා කැඳවීම

හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පොදු මහජනතාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන පහත උපලේඛනයේ සඳහන් මාර්ගය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය යටතේ හොරණ ප්‍රාදේශීය සභාව සතු පොදු මාර්ගයක් වශයෙන් පිළිගැනීමට මෙම ප්‍රාදේශීය සභාවේ 2025 ජූලි මස 01 වැනි දින අංක ඊ 01.10 දරන සභා සම්මුතියට අනුව තීරණය කරන ලද බැව් මෙයින් නිවේදනය කරමි.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව හෝ අදාළ ඉඩම් හිමියන් විසින් විරුද්ධත්වයක් දක්වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු මෙම නිවේදනය *ගැසට්* පත්‍රයේ පළ වූ දින සිට මාස 03 ක් ඇතුළත මා වෙත ලිඛිතව ඉදිරිපත් කිරීමට බලය තිබෙන බවත්. එකී කාලය තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවේ නම් එකී මාර්ගය හොරණ ප්‍රාදේශීය සභාව සතු පොදු මාර්ගයක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බවත්, පොදු ජනතාවගේ දැන ගැනීම පිණිස ප්‍රසිද්ධ කරමි.

ඩී. පී. නිර්මල ද සිල්වා,
සභාපති,
හොරණ ප්‍රාදේශීය සභාව.

2025 ජූලි මස 01 වැනි දින,
හොරණ ප්‍රාදේශීය සභාව,
කනන්විල.

**උපලේඛනය**

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *ආරම්භක ස්ථානය* | *අවසන් ස්ථානය* | *දිග (මීටර්)* | *පළල (මීටර්)* | *පිඹුරුපත් විස්තර* |
|---|---|---|---|---|---|---|
| 01 | නයාගොඩ කන්ද පාර | 120 හොරණ-කොළඹ මාර්ගය මාර්ග සංවර්ධන අධිකාරියට (RDA) අයත් මාර්ගය | හෝම් ලැන්ඩ් නිවාස යෝජනා ක්‍රමය Plan No. : $B^1$, 264 D, 1439 $B^2$, 264 | 557 | 9 | අංකය : 8680<br>දිනය : 2025/06/07<br>බලයලත් මිනින්දෝරු තැනගේ නම : P. M. සුනිල් |

08-283

---

## ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

### බිංගිරිය ප්‍රාදේශීය සභාව

මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධියට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සමග කියවිය යුතු 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 216 විධිවිධානවලට අනුකූලවන පරිදි විගණනය කළ බිංගිරිය ප්‍රාදේශීය සභාවේ 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය 2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ 2024.12.31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය මහජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රකාශයට පත් කරමි.

කේ. එම්. ඩී. එස්. කුමාරසිංහ,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
බිංගිරිය.

2025 අගෝස්තු මස 29 වැනි දින,
බිංගිරිය ප්‍රාදේශීය සභාවේ දී ය.

උපලේඛන I

**2024 දෙසැම්බර් මස 31 දිනට**

**මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන් | 2024 .12.31<br>රු. ශත | 2023.12.31<br>රු. ශත |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 06 | 371,429,578.12 | 369,325,214.85 |
| ජංගම වත්කම් | | | |
| තොග | 07 | 5,500,857.56 | 5,774,159.81 |
| ලැබිය යුතු දෑ | 08 | 22,465,163.17 | 43,411,464.40 |
| සේවක ණය හා අත්තිකාරම් | 09 | 12,261,056.07 | 10,378,380.18 |
| පෙර ගෙවුම් | 10 | 639,802.46 | 572,315.60 |
| ආයෝජන | 11 | 43,844,978.38 | 39,352,628.99 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 12 | 24,923,956.61 | 12,218,924.87 |
| **මුළු වත්කම්** | | **481,065,392.37** | **481,033,088.70** |
| වගකීම් | | | |
| ජංගම නොවන වගකීම් | 14 | 0.00 | 0.00 |
| ජංගම වගකීම් | 15 | 82,425,959.05 | 87,978,987.43 |
| හිමිකම් | | 398,639,433.32 | 393,054,101.27 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **481,065,392.37** | **481,033,088.70** |

උපලේඛන II

**2024 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය**

| | සටහන් | 2024 .12.31<br>රු. ශත | 2023.12.31<br>රු. ශත |
|---|---|---|---|
| **මෙහෙයුම් අයභාරය** | | | |
| රජයේ දායකත්වය - පුනරාවර්තන | 01 | 68,699,195.78 | 63,553,773.01 |
| වෙනත් අයභාරය | 02 | 82,846,143.23 | 94,027,161.72 |
| **මුළු මෙහෙයුම් අයභාරය** | | **151,545,339.01** | **157,580,934.73** |
| **මෙහෙයුම් වියදම** | | | |
| පුනරාවර්තන වියදම | 03 | 128,763,535.18 | 116,836,851.28 |
| **මුළු මෙහෙයුම් වියදම** | | **128,763,535.18** | **116,836,851.28** |
| වර්ෂය සඳහා වන මෙහෙයුම් අතිරික්තය/ඌණතාවය | | 22,781,803.83 | 40,744,083.45 |

| | සටහන් | *2024 .12.31* රු. ශත | *2023.12.31* රු. ශත |
|---|---|---|---|
| ප්‍රාග්ධන ලැබීම් | 04 | 0.00 | 8,545,796.86 |
| ප්‍රාග්ධන වියදම් | 05 | 20,102,738.00 | 37,503,614.44 |
| **වර්ෂය සඳහා වන අතිරික්තය/ඌණතාවය** | | **2,679,065.83** | **11,786,265.87** |

උපලේඛන III

2024 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | *31.12.2025* රු. ශත |
|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | |
| සාමාන්‍ය මෙහෙයුම් වලින් ලද අතිරික්තය/ඌණතාවය | 22,781,803.83 |
| මුදල් නොවූ සිදුවීම් සඳහා ගැලපීම් | |
| ක්ෂය වීම් | |
| පාරිතෝෂික වෙන් කිරීම් | |
| පෙර වර්ෂ සඳහා ගැලපීම් | 801,902.95 |
| කාරක ප්‍රාග්ධන වෙනස් වීම් වලට පෙර මෙහෙයුම් අතිරික්තය/ඌණතාවය | 23,583,706.78 |
| තොග ණයගැතියන්/අනෙකුත් ලැබීම් (වැඩිවීම්) අඩුවීම් | 14,777,091.34 |
| ණය හිමියන් ගෙවිය යුතු දෑ වැඩි වීම/(අඩු වීම) | -5,553,028.38 |
| 01. මෙහෙයුම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 32,807,769.74 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය | |
| දේපල අත්පත් කර ගැනීම්/ඉවත් කිරීම් | |
| ප්‍රාග්ධන වියදම් | -20,102,738.00 |
| 02. ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | -20,102,738.00 |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය | |
| ප්‍රාග්ධන ලැබීම් | 0.00 |
| ණය ආපසු ගෙවීම් | |
| 03. මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 0.00 |
| වර්ෂය තුළ ශුද්ධ චලනයන් (1+ 2 +3) | 12,705,031.74 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | 12,218,924.87 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ සටහන A | 24,923,956.61 |
| සටහන A | |
| ලංකා බැංකුව - ජංගම ගිණුම (පොදු) | 23,936,806.91 |
| ලංකා බැංකුව - ජංගම ගිණුම (සේවක ණය) | 987,149.70 |

08-344

# විවිධ දැන්වීම්

### කයිට්ස් ප්‍රාදේශීය සභාව

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අතුරු ව්‍යවස්ථාව අනුව වෙළඳ පොළ බදු නියාමනය කිරීම

2016.02.02 දින පළ කරන ලද අංක 1952/16 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* අංක 16 පරිච්ඡේදයේ 06 පරිච්ඡේදය අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වෙළඳ පොළ නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම, කළමනාකරණය සහ පාලනය කිරීම අතුරු ව්‍යවස්ථාවේ 1 කොටස අනුව, මුහුදු ආහාර මිල දී ගැනීමේ කාර්යයේ යෙදී සිටින ආයතනවලින් ස්ථාන බදු අය කළ යුතු බවත්, ඒ අනුව කයිට්ස් පොදු වෙළඳ පලින් දිනකට රුපියල් 1,000.00 මුදලක් බදු ලෙස අය කළ යුතු බව සභාව ඒකමතිකව තීරණය කරන ලදී.යෝජනාව ගරු ජේ. යුගන්දන් මන්ත්‍රීතුමා යෝජනා කළ අතර ගරු ඒ. ජී. ලක්ෂ්මන් මන්ත්‍රීතුමා අනුමත කරන ලදී.

08-294

---

### වෙංගල සෙට්ටිකුලම් ප්‍රාදේශීය සභාව

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා ආඥා පනතේ අංක 147, 148, 149, 150, 152,: (1), 109 (B), 126 වැනි කොටස් වලට අනුකුලවත් වෙංගල සෙට්ටිකුලම් ප්‍රාදේශීය සභාවේ අංක VCKPS/2025/08/02/11 හා 2025.08.12 දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණය ප්‍රකාරවත් 2025 ජනවාරි මාසයේ සිට පහත දැක්වෙන කාල සටහනට අනුව වාහනයේ කුළී මුදල් බව මෙයින් දන්වනු ලැබේ.

| *අනුක්‍රමික අංකය* | *ආදායම් වර්ගය* | *ස්ථාවර මුදල රු. ශත* |
|---|---|---|
| 01 | මෝටර් ග්‍රේඩරය (එක් පැයක් පමණි) | 8,000.00 |
| 02 | ජේසීබී (පැයකට) | 5,500.00 |
| 03 | රෝලර් (පැයකට) | 6,000.00 |
| 04 | පෙට්ටිය සහිත ටිලර් (එක් දිනක් සඳහා)<br>පැය 8 කට පසු සෑම පැයකටම අමතර ගාස්තුවක් | 8,000.00<br>1,000.00 |
| 05 | බවුසරයක් සහිත ට්‍රැක්ටරය - නිවසට ජලය ලබා දීම සඳහා (ලීටර් 3000) | 1,500.00 |
| 06 | බවුසරයක් සහිත ට්‍රැක්ටරය - ඉදිකිරීම් කටයුතු සඳහා (පැය අටයි)<br>පැය 8කට පසු සෑම පැයකටම අමතර ගාස්තුවක් | 8,000.00<br>1,000.00 |
| 07 | ජල බවුසරය පෞද්ගලික ඉදිකිරීම් කටයුතු (4000l)<br>කිලෝමීටර 01 ක් සඳහා | 4,000.00 +<br>120.00 |
| 08 | ලෝබෙඩ් ට්‍රේලරය සමග ට්‍රැක්ටරය නිශ්චිත වැඩ අනුව සඳහා | 6,000.00 |
| | පැයක් සඳහා | 2,500.00 |

සභාපති/ලේකම්,
වෙංගලසෙට්ටිකුලම් ප්‍රාදේශීය සභාව,
වවුනියාව.

08-316/1

## වෙංගල සෙට්ටිකුලම් ප්‍රාදේශීය සභාව

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා ආඥා පනතේ අංක 147, 148, 149, 150, 152,: (1), 109 (B), 126 වැනි කොටස් වලට අනුකූලවත් වෙංගල සෙට්ටිකුලම් ප්‍රාදේශීය සභාවේ අංක VCKPS/2025/08/02/10 හා 12.08.2025 දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණය ප්‍රකාරවත් 2025 ජනවාරි මාසයේ සිට පහත දැක්වෙන කාල සටහනට අනුව වැලි කැණීම් සහ ප්‍රවාහනය බව මෙයින් දන්වනු ලැබේ.

### වැලි කැණීම හා ප්‍රවාහනය කිරීම

| අනු අංක | අය කිරීම් ස්වභාවය | ගාස්තුව රු. |
|---|---|---|
| 01. | පරීක්ෂණ ගාස්තු (කිලෝමීටරයකට) | 100.00 |
| 02. | වැලි කැණීම් ගාස්තුව (කියුබ් 01) | 1,000.00 |

ලේකම්,
වෙංගලසෙට්ටිකුලම් ප්‍රාදේශීය සභාව,
වවුනියාව

08-316/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.